පොදු චක්‍ර ලේඛ ලිපි අංක : 02-165/2014

මගේ අංකය : සිඑෆ්/ඊඑක්ස්බී/01/2014
සෞඛ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10
2014.11. 14

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන්,
ඊබීය අමාත්‍යාංශ යටතට ගැනෙන
සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා
ආයතන ප්‍රධානීන් වෙත.

# සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2014

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරු සඳහා III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර සමත් වියයුතු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2014.12.27 දින දී සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍ය වලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත. (පත්වීමේ ලිපියෙහි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් සඳහන් වන හා / III ශ්‍රේණියට අයත් සියළුම නිළධරයන් මෙම විභාගයට පෙනිසිටීම අනිවාර්ය වේ).

## 02 සුදුසුකම්

මෙම විභාගයට අයදුම්කල හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරක **(සුහසාධක නිලධාරී, ප්‍රචාරක නිලධාරී, සුසමම දර්ශක ජායාරූප ශිල්පී, ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරී, ප්‍රජා සෞඛ්‍ය සමාජ සේවා නිලධාරී)** III ශ්‍රේණියේ පත්වීමක් ලබා සිටින නිලධාරීන්ට හා මේ වන විට විභාගය සම්පූර්ණ නොකළ නිලධාරීන්ට පමණි.

## 03. අයදුම්පත්

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2014.12.10** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාශ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. **තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.35.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය.** ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## 04. විභාග ගාස්තු

I. විභාගයට පළමු වන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළයුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 06. විභාග පරිපාටිය

මෙම විභාගය රචනා මාදිලියේ ලිඛිත පරීක්ෂණයකින් සමන්විත වන අතර ආයතන රෙගුලාසි සහ මුදල් රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතවේ. එක් ප්‍රශ්න පත්‍රයකට කාලය පැය 02 කි. සමත් වීම සඳහා අවම වශයෙන් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 40%ක් ලබාගත යුතුය.

## 07. විෂය නිර්දේශය

**විෂය නිර්දේශය** (එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.)

### 07:1 ලිඛිත පරීක්ෂණය

**ආයතන රෙගුලාසි**

**ආයතන සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| I | පරිච්ඡේදය | - | සාමාන්‍ය |
| II | පරිච්ඡේදය | - | සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටි සහ පත්කිරීම් |
| III | පරිච්ඡේදය | - | ස්ථාන මාරු කිරීම් |
| V | පරිච්ඡේදය | - | මුදා හැරීම, කලින් දැරූ තනතුරට සෙරළා යැවීම හා සේවය අවසන් කිරීම |
| VII | පරිච්ඡේදය | - | වැටුප් |
| VIII | පරිච්ඡේදය | - | අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු වැටුප් හා දීමනා |
| XII | පරිච්ඡේදය | - | නිවාඩු |
| XIV | පරිච්ඡේදය | - | දිවයින ඇතුළත රාජකාරි |
| XXVII | පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ පරිපාටිය |
| XXVIII | පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXXII | පරිච්ඡේදය | - | දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම |
| XXXIII | පරිච්ඡේදය | - | නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග |
| XLVII | පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII | පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රය :-

| | | | |
|---|---|---|---|
| III | වැනි පරිච්ඡේදය | - | පත් කිරීම් |
| V | වැනි පරිච්ඡේදය | - | රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන් |
| VI | වැනි පරිච්ඡේදය | - | පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් කොන්දේසි |
| VII | වැනි පරිච්ඡේදය | - | පත් කිරීම් වලදී අනුගමනය කලයුතු පරිපාටිය |
| VIII | වැනි පරිච්ඡේදය - | - | පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම |
| XIV | වැනි පරිච්ඡේදය | - | පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම |
| XV | වැනි පරිච්ඡේදය | - | තනතුර අතහැර යාම |

මුදල් රෙගුලාසි

**ගිණුම් ක්‍රම**

| | | | |
|---|---|---|---|
| I | පරිච්ඡේදය | - | වියදම් හා ආදායම් ඇස්තමේන්තු |
| II | පරිච්ඡේදය | - | වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාරී බලය |
| III | පරිච්ඡේදය | - | මුදල් පාලනය හා ගිණුම් ගත කල හැකි වීම |
| IV | පරිච්ඡේදය | - | ලැබීම් |
| V | පරිච්ඡේදය | - | ගෙවීම් |
| VI | පරිච්ඡේදය | - | ආණ්ඩුවේ මුදල යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම් |

❖ **රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාශයේ / විශේෂිත ව්‍යාපාරයේ / ආයතනයේ නියුතු සියළුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති 02 ඡේදයේ සඳහන් තනතුරු වල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

**එම් පී එල් රහුමාන්**
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් (පාලන 11)
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල් වෙනුවට

සුවසිරිපාය",
කොළඹ 10.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2014

**.................................................... තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2014**

**01** **(අ)** (i) අයදුම්කරුගේ නම ( සිංහලෙන් මුලකුරු අගට යොදා ලියන්න ) : ......................

..........................................................................................

(ii) අයදුම්කරුගේ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න ) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම් ( සිංහලෙන් ) : ......................................

..........................................................................................

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

**(ආ)**

i. තනතුර හා අයත් ශ්‍රේණිය ..................................................

ii. වර්තමාන තනතුරට පත්කළ දිනය ..........................................

iii. දැනට ලබන වාර්ෂික වැටුප ................................................

iv. දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

**02** ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න.

ආයතන රෙගුලාසි [ ] මුදල් රෙගුලාසි [ ]

**03** (අ) දැන් සේවය කරන ආයතනය (සිංහලෙන්)..............................................

(ඉංග්‍රීසියෙන්) ..............................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ..................................................................

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 35.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................

(ඈ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..............................................

..........................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..................................

..........................................................................................

**04** විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..................................

05 (අ) මිට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද ? ..............................................

(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද ? ..........................

| මුද්දර කොටුව |
|---|
| |

06 **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි..

දිනය ......................　　　　　　　　　　　　　　　　　　..........................................
අයදුම්කරුගේ අත්සන

..........................................................................................................................................

07 **පෞද්ගලික ලිපිගොනු භාර විෂය කළමනාකරණ සහකාරවරයාගේ /වරියගේ සහතිකය**

මෙම අයදුම්පත බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය .........................................　　　　　　　　　　　　..........................................
නම සහ අත්සන

08 **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..........................................................මහතා / මහත්මිය / මෙනවිය ..................................

නිළධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

**දිනය** ......................　　　　　　　　　　　　..........................................

**ආයතන ප්‍රධානියාගේ අත්සන**
**[ රබර් මුද්‍රාව තැබිය යුතුය]**

09 **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..........................................................මහතා / මහත්මිය / මෙනවිය, ...................................

නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාශයේ / ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

**දිනය** ......................　　　　　　　　　　　　..........................................

**විමධ්‍යගත කොට්ඨාශ**
**විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ**
**අත්සන [ රබර් මුද්‍රාව තැබිය යුතුය]**